**වාරියපොළ ප්‍රාදේශීය සභාව - 2020**

-----------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

------------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

වාරියපොළ ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට වාරියපොළ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන්, ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී, වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී ,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද, යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වා ගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීතී,රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) ප්‍රාදේශීය සභාවේ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් පැවරුම් නියෝග යටතේ ලැබී තිබූ අක්කර 5 රූඩ් 2 ක් වූ ඉඩම් 04 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට සටහන් කර ගතිමි. | සභාව සතු ඉඩම් හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂවල ඉඩම් වෙන්දේසිවලින් සභාවට පැවරූ වටිනාකම රු. 1,636,562 ක් වූ ඉඩම් කට්ටි 9 ක් හා වටිනාකම තක්සේරු නොකළ රූඩ් 4 පර්චස් 24 ක් වූ ඉඩම් 04 ක් ගිණුම්ගත කර නොතිබුණි. | මේ පිළිබඳව සොයා බලා නිවැරදි කිරීමට කටයුතු කරමි. | සියළුම වෙන්දේසි ඉඩම් වලින් සභාවට පවරන ලද ඉඩම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉඩම් හා ගොඩනැගිලි සංවර්ධනයට දරා තිබුණු වටිනාකම රු.10,193,877 ක් ගිණුම්ගතකර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට සටහන් කර ගතිමි. | සියළුම ගොඩනැගිලි සංවර්ධන වියදම් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කළ යුතු වේ. |

**1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂවලදී ඉඩම් වෙන්දේසිවලින් සභාවට පවරා තිබූ රු.10,417,672 ක් වටිනාකම වූ ඉඩම් කැබැලි 10 කට අදාලව ඔප්පු වෙන්දේසි හිමියා විසින් සභාවට ලබාදී නොතිබීම හේතුවෙන් මෙම ඉඩම්වල අයිතිය තහවුරු කර ගැනීමට නොහැකිවීම හා එම ඉඩම් අයථා පරිහරණයක් සිදුව ඇති බව විගණනයට නිරීක්ෂණය විය. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | වෙන්දේසි ඉඩම් හඳුනාගෙන ඒවා ලේඛනගත කර අයිතිය සනාථ කරන ඔප්පු තබාගත යුතු වේ. |

**1.7 අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති , රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2020 මාර්තු අංක PL/7/1/18/1 පොදු දරන රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ චක්‍රලේඛයේ 3ඡේදය | පළාත් සභා හෝ පළාත් පාලන ආයතන සතු අරමුදල මගින් නොමිලයේ භාණ්ඩ ලබාදීම ප්‍රවර්ධනය නොකළ යුතු බවට උපදෙස් දී තිබියදීත්, සභා අරමුදලින් කොවිඩ් වසංගත කාලයේදී 2020 මැයි 29 දින ආහාර මළු 1,360 ක් ලබාදීම සඳහා රු1,567,935 ක මුදලක් වැයකර තිබුණි. | වයඹ පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාගෙන මෙම වියදම් දරා ඇති බව සඳහන් කරමි. | මෙම ආපදා තත්ත්වය තුළ කටයුතු කිරීමට නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | 1996 මාර්තු 10 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශිත නාගරික සංවර්ධන අධිකාරී සැලසුම් හා ගොඩනැගිලි නියෝග 22 හා 1996 අගෝස්තු 06 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශිත නාගරික සංවර්ධන අධිකාරී සැලසුම් හා ගොඩනැගිලි නියෝග | කොටස් කරන ලද ඉඩමේ මාර්ග හා රක්ෂිත සඳහා වූ ඉඩම් ප්‍රමාණය හැර ඉතිරි කොටසින් 10% ක ඉඩම් ප්‍රමාණයක් ප්‍රාදේශීය සභාව වෙත පොදු කටයුතු සඳහා පවරා ගතයුතු වුවත්, වෙන්දේසි ඉඩම් 04 කින් පොදු කටයුතු සඳහා ලබාගත යුතු පර්චස් 288.84 ක ඉඩම් කොටස්වලට අදාළ ඔප්පු ලිපිගොනුවේ නොතිබුණි. | සමහර ඉඩම්වල භූමි ප්‍රමාණ වෙන්කර ඇති අතර, ඔප්පුව ලබාදෙන ලෙස දන්වා ඇති බව දන්වමි. මිහින් සිටී ලෑන්ඩ්, මිහින් සිටී රිච් ලෑන්ඩ් වශයෙන් නිවැරදි විය යුතු අතර පර්. 98.5 ක ඉඩම් ප්‍රමාණය ලැබී ඇත. | වෙන්දේසි ඉඩම් වලින් පොදු කටයුතු සඳහා ඉඩම් කොටස් ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.59,226,510 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 39,608,022 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 ජනවාරි 01 දිනට රාජ්‍ය බැංකුවල තැන්පත් කර තිබූ සභාව සතු රු.108,896,424 ක් වූ ස්ථාවර තැන්පතුවලින් රු.66,609,779 ක් වටිනා ස්ථාවර තැන්පත් 5ක් නිදහස් කරගෙන තිබුණද ඒ සඳහා සභා අනුමැතියක් ලබාගෙන නොතිබුණි. සභාවේ වාර්ෂික අයවැයෙන් බාහිරව සිදුකරන වැයකිරීම් සඳහා පරිපූරක ඇස්තමේන්තුවක් පිළියෙල කර මහා සභා අනුමැතිය ලබාගත යුතු වුවත්, මෙම කර්මාන්ත ඉටුකිරීම සඳහා ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මේ සඳහා අනුමැතියක් ලබාගත යුතු බවට රීති වල හෝ පනතේ දක්වා නොතිබුණි. | මහා සභා අනුමැතිය ලබාගෙන ස්ථාවර තැන්පතු මාරු කරගත යුතු වේ. මෙම ස්ථාවර තැන්පතු වලින් පරිපූරක ඇස්තමේන්තු අනුමත කරගෙන වියදම් කළ යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා ආඥාපනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය , පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| හොරොම්බුව වෙන්දේසි ඉඩමෙන් ක්‍රීඩාංගණයක් ඉදිකිරීමට තීරණය කර තක්සේරු කිරීමකින් තොරව මෙම භූමියේ පිහිටි පොල් ගස් 19 ක් කපා ඉවත්කර තිබුණි. මෙම ක්‍රීඩාංගනය ඉදිකිරීමට 2019 වර්ෂයේ සභා අරමුදලින් රු.964,350 ක් වැයකොට ඉදිකර තිබූ වොලිබෝල් ක්‍රීඩාපිටිය කඩා ඉවත් කිරීමට සුදුසු බව තීරණය කර තිබුණි. මෙම භූමියේ ඉදිකිරීමට යෝජිත ක්‍රීඩා පිටියෙහි කොටසක් අනුමැතියකින් තොරව පස් කපා ඉවත් කරගැනීමට බාහිර පාර්ශවයක් විසින් කටයුතු කර තිබුණි. | මෙම බොරළු කැපීම සම්බන්ධව ගරු සභාපතිවරයාට එරෙහිව නඩුවක් විභාග වෙමින් පවතී. | සභාවේ ඉඩම්වල ගස් ඉවත් කිරීම තක්සේරු කළයුතු අතර ඵලදායී ව්‍යාපෘති තෝරාගෙන සභා අරමුදල් වැය කිරීමට කටයුතු කළ යුතු වේ. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පොදු වෙළඳපොල බිම් මහල සහ පළමු මහල කඩ කාමර 48 ක් 2019 ජූලි 19 දින තක්සේරු කර තිබුණද එම තක්සේරුව ක්‍රියාත්මක නොකිරීම නිසා 2020 වර්ෂය සඳහා සභාවට රු.2,202,300 ක ආදායමක් අහිමි වී තිබුණි. | තක්සේරුව ක්‍රියාත්මක කිරීමට 2019 අගෝස්තු 28 දින පැවති මුදල් හා ස්ථාවර පොදු කාරක සභාවේදී අනුමැතිය ලබා දී ඇති අතර, විරෝධතා හේතුවෙන් අය නොකර සිටියද, මෙම සියළු කඩ කාමර වල මාසික කුලිය නව තක්සේරුව අනුව බිල් කර ඇති බව දන්වමි. | නව තක්සේරුව අනුව බිල්කළ කඩකුලී කඩිනමින් අයකිරීම සඳහා කටයුතු කළ යුතුවේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු වරිපනම්, අක්කර බදු, කුලී, නඩු හා කර්මාන්ත ණයගැතියෝ එකතු වටිනාකම රු.101,698,148 ක් විය. ඒ පිළිබඳ කාල විශ්ලේෂණයට අනුව වසර 1 සිට 5 දක්වා කාලයට අදාළ ගිණුම් ශේෂ එකතුව රු.18,731,370 ක් වූ අතර, වසර 5ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂ එකතුව රු.91,560 ක් බව නිරීක්ෂණය විය. | මෙම ශේෂ අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. | ලැබිය යුතු ශේෂ පිළිබඳව සොයා බලා අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 වර්ෂයේ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන යටතේ අවුලේගම නබඩවැව මාර්ගය තාර දැමීමේ ව්‍යාපෘතිය සඳහා රු.1,768,565 ක මුදලක් වැයකර තිබුණි. භෞතිකව පරීක්ෂාවේදී මීටර් 400 ක් පමණ දිග මෙම පාරෙහි නිමාව දුර්වල තත්ත්වයක පැවතුණි. සම්පූර්ණ මාර්ගයේ අගල් 1½" කැටගල් මතුවී තිබූ අතර, මාර්ගයේ පෘෂ්ඨය සුමටව නොතිබුණු බවත්, මාර්ගයේ දෙපස නිමාවද දුර්වලව පැවතුණි. මාර්ගයේ දෙපස කොටසෙහි මිලි මීටර් 300 ක පමණ ප්‍රමාණයක මාර්ගයේ මැද කොටසෙහි තාර මිශ්‍රණයට වඩා නිමාව දුර්වල මට්ටමක පැවතුණි. | ඔබ විසින් පෙන්වා දී ඇති කරුණු පිළිගන්නා අතර මෙම මාර්ගය සඳහා රැඳවුම් මුදල් නිදහස් කර නොමැති අතර, මෙම අඩුපාඩු යථා තත්ත්වයට පත්කරන ලෙස දන්වා ගිවිසුම් ගත සංවිධානයට ලිපියක් යොමුකර ඇති බවත් සඳහන් කරමි. | මාර්ග ඉදිකිරීමේදී තාක්ෂණික නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ප්‍රමිතියට අනුව කටයුතු කළ යුතු වේ. මාර්ගයේ අඩුපාඩු නිවැරදි කිරීමටද කටයුතු කළ යුතු වේ. |